යම් කිසි පුවතක් පළ කිරීමේදී, එම පුවතෙහි මෙන්ම මාධ්‍යයේ ද විශ්වසනීයත්වය තහවුරු කිරීම සඳහා, නිරවද්‍ය සහ විශ්වසනීය මූලාශ්‍ර සඳහන් කිරීම අත්‍යවශ්‍ය වේ. එහිදී, මූලාශ්‍ර සඳහන් නොකිරීම සාමාන්‍ය භාවිතාව නොවිය යුතු වේ. හෙළිදරව් කෙරෙන්නේ තොරතුරු මිස මතයක් හෝ අනුමානයක් නොවන්නේ නම්, එම තොරතුර රහස්‍ය මූලාශ්‍ර ඔස්සේ මිස වෙනත් ආකාරයකින් ලබාගැනීමට නොහැකි නම් සහ, මූලාශ්‍රය එම තොරතුරට සෘජුවම සම්බන්ධ, විශ්වසනීය එකක් නම් හැරෙන්නට, අඥාත මූලාශ්‍ර භාවිතා නොකිරීමට මාධ්‍ය මාර්ගෝපදේශයන් මගින් උපදෙස් දෙනු ලැබේ.
ඒ හැරෙන්නට, මූලාශ්‍රය හෙළිදරව් කිරීම සඳහා මූලාශ්‍රයෙන් අවසර ලැබීම ද අවශ්‍ය වේ.
DailyMirror පුවත්පතේ, "Journalist falsely seeks asylum?" යන සිරස්තලයෙන් යුතුව පළ වූ පුවතක්, ඉහත පසුබිම තුළ අපට විමසා බැලිය හැක. එහි මූලාශ්‍ර ලෙසින් සඳහන් වන්නේ informed sources (තතු දත් ආරංචි මාර්ග) වේ.
DailyMirror සිරස්තලයෙන් මෙය නිසැකවම තහවුරු කරගත් කරුණක් ලෙසින් නොව, ආරංචි මාර්ග වලට අනුව සිදුවූ බවට පැවසෙන කරුණක් ලෙසින් ප්‍රශ්නාර්ථයක් ද සහිතව ඉදිරිපත් කර ඇත.
ඔබ සිතන ලෙසට,
DailyMirror පුවත විශ්වසනීය සහ පිළිගත හැකි ප්‍රවෘත්තියක් ලෙස සැලකිය හැකිද?
මූලාශ්‍ර සඳහන් කිරීම පිළිබඳ මාධ්‍ය මාර්ගෝපදේශයන්:
https://ethics.journalists.org/topics/confidential-sources/
https://www.ap.org/.../telling-the-story/anonymous-sources
https://www.reutersagency.com/en/about/standards-values/...
**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.
*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!

